
# 20

# හදීස්




මිනිසුන්ට මග පෙන්වීම සඳහා අල්ලාහුතආලා විසින් මුහම්මද් (සල්) තුමාණන් එවන ලදී. ඒ සමඟ ම නබිතුමාණන්ට අල්කුර්ආනය පහළ කළේ ය. අල්කුර්ආනයේ මග පෙන්වීම් මිනිස් සමාජයට දේශනා කළ මුහම්මද් නබි (සල්) තුමාණන්ගේ ජීවිතය මුළු මිනිස් සංහතියට ම ආදර්ශවත් වේ. මෙම ජීවන ක්‍රමය සුන්නා යනුවෙන් හඳුන්වනු ලැබේ.

ඉස්ලාමයේ ප්‍රාථමික මූලාශ්‍රය ලෙස අල්කුර්ආනය හා සුන්නාව පවති. අල්ලාහුතආලාගේ විශේෂ ඥානය හා සම්බන්ධ වී ඇති බැවින් අල්කුර්ආනය මූලික නීති මූලාශ්‍රය ලෙස පිළිගනු ලැබේ. අල්කුර්ආනයේ පහදා දීම ලෙසත් ක්‍රියා පිළිවෙළ ලෙසත් පවතින සුන්නාව ද්විතීය මූලාශ්‍ර ලෙස පිළිගනු ලැබේ.

හදීස් යනු නබි (සල්) තුමාණන්ගේ වදන්, ක්‍රියා, අනුමත කිරීම්, ගුණාංග, වර්ණනාවන් යනාදිය වේ. එනම් නබි (සල්) තුමාණන් පැවසූ දෑ, ඉටුකළ දෑ,

ඉටුකරන ලෙස අණ කළ දෑ, එමෙන් ම එතුමන්ගේ නියෝග, ලිපි, ගිවිසුම්, අනුමත කිරීම්, සියල්ල හදීස් යනුවෙන් හැඳින්වේ. හදීස්, සුන්නා යන පද දෙකම හදීස් ක්ෂේත්‍රයේ විද්වතුන් විසින් එකම අර්ථයකින් භාවිත කෙරෙයි.

අල් කුර්ආනයට විවරණයක් ලෙස හදීස් පවතී. හදීස් නොමැතිව අල් කුර්ආනය අවබෝධ කරගත නොහැකි ය. අල් කුර්ආනයේ කෙටියෙන් සඳහන් කළ කරුණු වලට විස්තරාත්මක අවබෝධය හදීස් මගින් පමණක් ලබාගත හැකි ය. නබි(සල්) තුමාණන් අල් කුර්ආනය ඉගැන්වීමේ වගකීම සහිතව යවන ලදී. එබැවින් අල් කුර්ආනයේ ප්‍රායෝගික ආදර්ශය ලෙස හදීස් දක්නට ලැබේ. එබැවින් සහීහ් වූ හදීස් කිසි විටකත් කුර්ආනයට පටහැනි නොවේ.

නබි (සල්) තුමාගේ කාලයේ ජීවත් වූ සහාබාවරුන් විසින් එතුමාණන්ගේ හදීසයන් කටපාඩම් කිරීම මගින් ආරක්ෂා කරන ලදි. සහාබාවරුන් අතරින් ආයිෂා රළයල්ලාහු අන්හා ඉබ්නු උමර් රළියල්ලාහනු අන්හු අබූහුරෙයිරා රළියල්ලාහනු අන්හු යනාදීහූ හදීස් ක්ෂේත්‍රයේ විශේෂඥ වූහ. අනතතුරු ව පසු කාලයේ බිහි වූ විද්වතුන් විසින් හදීස් ග්‍රන්ථ වශයෙන් සංස්කරණය කරන ලදි. ඒ අතර අස්සිහා හුස්සිත්තා නැමැති හදීස් ග්‍රන්ථ හය ඉහළ වැදගත්කමක් උසුලයි.

අල්කුර්ආනයත් සුන්නාවත් හදීසයේ වැදගත්කම අවධාරණය කරයි. පහත සඳහන් අයුරින් අල්ලාහ් අල්කුර්ආනයේ පවසන්නේ ය.

"රසූල් ඔබ වෙත කුමක් රැගෙන ආවේ ද, එය පිළිගන්න ඔහු වැළැක් වූ දෙයින් වැළැකී සිටින්න" තවත් තැනක "අල්ලාහ්ගේ දූතයා ළඟ ඔබට යහපත් ආදර්ශයන් ඇත"(33:21). මෙලෙස සුන්නාවේ වැදගත්කම පිළිබඳ ව අල්කුර්ආනයේ පවසන්නේ ය.

"එසේ ම මම ඔබට කරුණු දෙකක් හැර යන්නෙමි. එම කරුණු දෙක පිළිපදින තාක්කල් ඔබ නො මග නො යනු ඇත. අල්ලාහ්ගේ ආගම එකකි. අනෙක මාගේ මග පෙන්වීම් ය (මුවත්තා)" යනුවෙන් නබි (සල්) තුමාණෝ පැවසූහ.

එබැවින් හදීසයන් ඉගෙනීමත්, පිළිපැදීමත්, එය ආරක්ෂා කිරීමත්, දේශනා කිරිමත් අපගේ යුතුකම වේ.

අපි දැන් හදීස් කිහිපයක් ගැන සළකමු.

හදීස් 1

عَنْ أَبِي هُرَيْرَةَ رَضِيَ اللَّهُ عَنْهُ قَالَ، قَالَ رَسُولُ اللَّهِ صَلَّى اللَّهُ عَلَيْهِ وَسَلَّمَ:

''إِنَّ اللَّهَ لا يَنْظُرُ إِلَى صُوَرِكُمْ وَأَمْوَالِكُمْ وَلَكِنْ يَنْظُرُ

إِلَى قُلُوبِكُمْ وَأَعْمَالِكُمْ''(متفق عليه)

"නියත වශයෙන් ම අල්ලාහ් ඔබගේ හැඩරුව හෝ ධන සම්පත් දෙස නොබලන්නේ ය. නමුත් ඔබගේ හදවත හා ක්‍රියාවන් දෙස බලන්නේ ය" යනුවෙන් නබි(සල්) තුමාණන් පැවසූ බව අබූ හුරෛරා (රළි) තුමා වාර්තා කරයි. (මූලාශ්‍රය මුස්ලිම්)

ශදීස් 2

عَنْ أَبِيْ مُوْسَى الْأَشْعَرِي رَضِيَ اللَّهُ عَنْهُ قَالَ: قَالَ رَسُوْلُ اللَّهِ صَلَّى اللَّهُ

عَلَيْهِ وَسَلَّمَ: ''أَطْعِمُوا الْجَائِعَ، وَعُوْدُوْا الْمَرِيْضَ، وَفُكُّوْا الْعَانِيَ''

(رواه البخاري)

"බඩගින්නේ පසුවන්නන්ට ආහාර සපයන්න. රෝගීන්ගෙන් සුවදුක් විමසන්න. සිරකරුවන් නිදහස් කිරීමට උපකාර වන්න" යනුවෙන් නබි (සල්) තුමාණෝ පැවසූ බව අබූ මූසා (රළි) තුමා වාර්තා කරයි. (මූලාශ්‍රය බුහාරි)

හදීස් 3

عَنْ أَبِي هُرَيْرَةَ رَضِيَ اللَّهُ عَنْهُ قَالَ، قَالَ رَسُولُ اللَّهِ صَلَّى اللَّهُ عَلَيْهِ وَسَلَّمَ:

"وَالَّذِي نَفْسِي بِيَدِهِ لاَ تَدْخُلُوا الْجَنَّةَ حَتَّى تُؤْمِنُوا ، وَلاَ تُؤْمِنُوا

حَتَّى تَحَابُّوا ، أَوَلاَ أَدُلُّكُمْ عَلَى شَيْءٍ إِذَا فَعَلْتُمُوهُ تَحَابَبْتُمْ ؟

أَفْشُوا السَّلاَمَ بَيْنَكُمْ". (رواه مسلم)

"ඔබ ඊමාන් ධාරියකු වන තුරු ස්වර්ගයට නොපිවිසෙන්නේ ය. ඔබ එකිනෙකාට සෙනෙහස දක්වන තුරු ඊමාන්ධාරියකු නොවන්නේ ය. ඔබ අතර සෙනෙහස ඇති කරන යම් දෙයක් ගැන මම පවසන්න දැ"යි අසා, "ඔබ අතර සලාමය පතුරුවන්න" යනුවෙන් නබි (සල්) තුමා පැවසූ බව අබූ මූසා (රළි) තුමාණෝ වාර්තා කරති. (මූලාශ්‍රය මුස්ලිම්)

හදීස් 4

عَنْ عَبْدِ اللَّهِ بْنِ مَسْعُودٍ رَضِيَ اللَّهُ عَنْهُ قَالَ:

قَالَ رَسُولُ اللَّهِ صَلَّى اللَّهُ عَلَيْهِ وَسَلَّمَ:

" وَإِنَّ الْكَذِبَ يَهْدِي إِلَى الْفُجُورِ وَإِنَّ الْفُجُورَ يَهْدِي إِلَى النَّارِ

وَإِنَّ الرَّجُلَ لَيَكْذِبُ حَتَّى يُكْتَبَ عِنْدَ اللَّهِ كَذَّابًا " [البخاري]

"නියත වශයෙන් ම අසත්‍යය (බොරුව) පාපයට මග පෙන්වයි. පාපය නිරයට මග පෙන්වයි. අධික වශයෙන් අසත්‍ය ප්‍රකාශ කරන්නා අල්ලාහ් සන්තකයේ බොරුකාරයා වශයෙන් සටහන් කරනු ලබයි. "යනුවෙන් නබි (සල්) තුමාණන් පැවසූ බව ඉබ්නු මස්ඌද් (රළි) තුමාණෝ වාර්තා කරන්නාහ. (මූලාශ්‍රය බුහාරි )

අභ්‍යාස

**පහත සඳහන් ප්‍රකාශ හරි නම් ☑ ලකුණ ද වැරදි නම් ☒ ලකුණ ද යොදන්න**

1. අල් හදීස් ඉස්ලාමයේ ප්‍රාථමික මූලාශ්‍රය වේ ( )
2. අස්සිහා හුස්සිත්තාහ් යනු කුර්ආන් විවරණ ග්‍රන්ථයකි ( )
3. නබි (සල්) තුමාගේ ජීවන ක්‍රමය සුන්නා යනුවෙන් හඳුන්වනු ලැබේ ( )
4. හදීස් හා සුන්නා යනු වෙනස් වූ අරුත් දෙන පද දෙකකි ( )
5. හදීසයට විස්තරයක් ලෙස කුර්ආනය පවතී ( )
6. ආයිෂා (රළි) තුමිය හදීස් ග්‍රන්ථාරූඪ කළා ය ( )
7. ඉබ්නු උමර් (රළි) තුමා හදීස් කටපාඩම් කළ අය අතර වැදගත් කෙනෙකි ( )
8. අල්ලාහ් මිනිසුන්ගේ සිත පමණක් බලන්නේ ය ( )

ක්‍රියාකාරකම්

1. ඔබ ඉගෙන ගත් හදීස් හා එහි අර්ථයන් බ්‍රිස්ටල් කාඩ් පතක ලියා පන්ති කාමරයේ එල්ලන්න.